පිළියන්දල අධ්‍යාපන කලාපය

Education Zone - Piliyandala

වර්ෂ මැද ඇගැයීම - 2017

Mid Year Evaluation

ශ්‍රේණිය Grade } 6	විෂයය Subject } විද්‍යාව	පත්‍රය Paper } I,II	කාලය Time } පැය 02යි

නම:- ....

සැලකිය යුතුයි:-

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1,2,3,4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

01. හරිත ශාක ප්‍රභාසංශ්ලේෂණය සඳහා වායුගෝලයෙන් ලබා ගන්නා වායුව කුමක් ද?
    1. ඔක්සිජන් 2. කාබන්ඩයොක්සයිඩ් 3. හයිඩ්‍රජන් 4. නයිට්‍රජන්

02. ජීවීන්ට පොදු නොවන ලක්ෂණයකි,
    1. ශ්වසනය 2. වර්ධනය 3. සංචරණය 4. ප්‍රජනනය

03. පහත රූපයෙන් දැක්වෙන්නේ,



    1. මුහුදු මලකි 2. කොරල් මුහුබාවෙකි
    3. ක්ෂුද්‍ර ජීවියෙකි. 4. කකුළුවෙකි.

04. පහත ප්‍රකාශ වලින් සත්‍ය ප්‍රකාශය තෝරන්න.
    1. යම් වස්තුවක අඩංගු පදාර්ථ ප්‍රමාණය එහි ස්කන්ධය ලෙස හැඳින්වේ.
    2. ස්කන්ධය ප්‍රකාශ කිරීම සඳහා කිලෝග්‍රෑම්, ග්‍රෑම්, මිලිග්‍රෑම් වැනි ඒකක භාවිතා වේ.
    3. ස්කන්ධය ප්‍රකාශ කිරීමේ ජාත්‍යන්තර සම්මත ඒකකය කිලෝග්‍රෑම් (kg) වේ.
    4. ස්කන්ධයක් රහිත අවකාශයේ ඉඩක් ගන්නා දේ පදාර්ථ වේ.

05. පරිසරයේ ඇති ඉඩක් අත්කර ගන්නා දෙයකි.
    1. වාතය 2. ශබ්දය 3. තාපය 4. ආලෝකය

06. ඝන අවස්ථාවේ ඇති ජලය, ද්‍රව අවස්ථාවට පත්වීම සිදුවන්නේ පහත කුමන අවස්ථාවේ දී ද?
    1. දිය ඇල්ලකින් ජලය පහළට ඇද හැලීම. 2. භාජනයක ජලය රත්කරන විට ජලය වාෂ්ප වීම.
    3. ග්ලැසියර් දියවීම. 4. උණුදිය උල්පත් වලින් ජලය ඉහළට විදීම.

07. ජල දූෂණය වැළැක්වීමට සඳහා කළ යුත්තේ කුමක් ද?
    1. කෘමිනාශක භාවිතය අවම කළ යුතුය.
    2. කම්හල්වල අපද්‍රව්‍ය විෂ නසා ජලයට එක් කළ යුතුය.
    3. ඉවතලන ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කළ යුතුය.
    4. ඉහත සඳහන් සියලුම ක්‍රියා සුදුසු ය.

08. ආහාර නිෂ්පාදනය කරන නිසා ශාක .... ලෙස හඳුන්වයි. හිස්තැනට සුදුසු වචනය තෝරන්න.
    1. විෂමපෝෂීන් 2. ස්වයංපෝෂීන් 3. ක්ෂුද්‍ර ජීවීන් 4. මහා ජීවීන්

09. a. ජීවී දේහවල පෝෂක පරිවහනයට
    b. බහිස්‍රාවී මාධ්‍යයක් ලෙස
    c. ශාක තුළ ආහාර නිපදවීමට

ජීවීන්ට ජීවය පවත්වා ගැනීමට ජලය වැදගත් වන ආකාර කීපයක් ඉහත දැක්වේ. ඒවායින් සත්‍ය වනුයේ,
    1. a හා b පමණි. 2. b හා c පමණි. 3. a හා c පමණි. 4. ඉහත සියල්ලම ය.

10. පොසිල ඉන්ධනවලින් ලබා දෙන්නේ කුමන ශක්තිය ද?
   1. තාප ශක්තිය යි.   2. ධ්වනි ශක්තියයි.
   3. සූර්ය ශක්තියයි.   4. සුළං ශක්තියයි.

11. පොළව අභ්‍යන්තරයේ අධික ලෙස උණුසුම් ප්‍රදේශවල පවතින තාපය යොදා ගෙන,
   1. විද්‍යුත් ශක්තිය නිපදවයි.   2. පහළ ඇති ජලය ඉහළට ගෙන එයි.
   3. ආහාර පිසීම සිදු කරයි.   4. තාප උදුන් නිපදවයි.

12. න්‍යෂ්ටික ශක්තියේ විශේෂත්වය වන්නේ,
   1. පරිසර දූෂණය නොවීමයි.   2. විශාල ශක්ති ප්‍රමාණයක් ලැබීමයි.
   3. අඩු වියදමකින් ශක්තිය ලැබීමයි.   4. සෑම රටකට ම භාවිත කළ හැකි වීමයි.

13. පෙනීම සඳහා අවශ්‍ය <u>නොවන</u> සාධකය කුමක් ද?
   1. ඇස   2. ආලෝකය   3. අඳුර   4. වස්තුව

14. ලංකාවේ ප්‍රධාන නගර හරහා දුරකථන සම්බන්ධතා ජාලය සකස් කර ඇත්තේ,
   1. ආලෝක කිරණ මගිනි.   2. කම්බි මගිනි.
   3. ප්‍රකාශ තන්තු මගිනි.   4. ලේසර් කිරණ මගිනි.

15. මෙම ක්‍රියාකාරකම සිදු කර ඇත්තේ කුමකට ද?



   1. ආලෝකය සරල රේඛීය ගමන් කරන බව පෙන්වීමට ය.
   2. ආලෝකය ඉටිපන්දමෙන් නිකුත් වන බව පෙන්වීමට ය.
   3. පෙනීම සඳහා ඇසේ අවශ්‍යතාව පෙන්වීමට ය.
   4. ලී පාරාන්ධ නිසා ආලෝකය ගමන් නොකරන බව පෙන්වීමට ය.

16. ස්වභාවික ශබ්දයක් වන්නේ පහත සඳහන් ඒවායින් කවරක් ද?
   1. බල්ලන්ගේ බිරුම් හඬ   2. මෝටර් රථ හඬ   3. පාසල් සීනු හඬ   4. ගුවන් යානයක හඬ

17. බෙරයක ආකාරයට ශබ්දය නිපදවෙන භාණ්ඩ වර්ගය තෝරන්න.
   1. ගිටාරය   2. බටනලාව   3. උඩැක්කිය   4. ට්‍රම්පට් එක

18. වලයාකාර චුම්බකයක් භාවිත කරන උපකරණය කුමක් ද?
   1. ශීතකරණයේ දොර   2. මෝටරය   3. කවකටු පෙට්ටිය   4. ස්පීකරය

19. දණ්ඩ චුම්බකයක, චුම්බක ක්ෂේත්‍රය නිවැරදිව දැක්වෙන රූපසටහන පහත ඒවායින් කවරක් ද?



1.   2.   3.   4.

20. රූපයේ දක්වා ඇති චුම්බක වර්ගවල නිවැරදි අනුපිළිවෙල වන්නේ,

   1. බූරප චුම්බක, වලයාකාර චුම්බක, U ආකාර චුම්බක, දණ්ඩ චුම්බක
   2. වලයාකාර චුම්බක, U ආකාර චුම්බක, බූරප චුම්බක, දණ්ඩ චුම්බක
   3 වලයාකාර චුම්බක, බූරප චුම්බහබය, U ආකාර චුම්බක, දණ්ඩ චුම්බක
   4. බූරප චුම්බක, වලයාකාර චුම්බක, දණ්ඩ චුම්බක, U ආකාර චුම්බක

**

විද්‍යාව - II පත්‍රය

❖ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 ක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

01. ශිෂ්‍යයෙක් විද්‍යා ක්‍රියාකාරකමක දී ඉටිපන්දම් දැල්ල දෙස බලන ආකාර 3 ක් පහත රූපවල දැක්වේ.



ඔහුගේ නිරීක්ෂණ පහත ආකාර වේ.

A - ඉටිපන්දම් දැල්ල පැහැදිළිව පෙනේ. ආලෝකය ද පෙනේ.
B - ඉටිපන්දම් දැල්ල නොපෙනේ.
C - ආලෝකය දැකිය හැකියි. ඉටිපන්දම් දැල්ල පැහැදිළිව නොපෙනේ.

i. තුනී වීදුරු, කාඩ්බෝඩ් යන ද්‍රව්‍ය අතරින් A, B, C සඳහා සුදුසු ද්‍රව්‍යය වලට උදාහරණය බැගින් ලියන්න.

ii. A, B, C යන ද්‍රව්‍යය පාරදෘශ්‍ය, පාරභාසක, පාරාන්ධ ලෙස වර්ග කරන්න. (ලකුණු 6)

B. i. " දැල්වූ විදුලි බුබුල, ඊ බදුල්ලා, චන්ද්‍රයා, ග්‍රහලෝක, කණාමැදිරියා, දැල්වූ ඉටිපන්දම " යන වස්තු යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

ස්වාභාවික දීප්ත වස්තු	කෘත්‍රිම දීප්ත වස්තු	අදීප්ත වස්තු

ii. ආලෝක කිරණයක් හා ආලෝක කදම්බයක් රූපසටහනක ඇඳ නම් කරන්න. (ලකුණු 6)

C. කුඩු ලිපක ඉන්ධනය ලෙස ජෛව ස්කන්ධ භාවිත කරයි.

i. ජෛව ස්කන්ධය යනු මොනවාද?
ii. කුඩු ලිප සඳහා යොදා ගන්නා ජෛව ස්කන්ධය මොනවාද?
iii. කුඩු ලිපේ වාසි 2 ක් ලියන්න. (ලකුණු 4)

02. පහත සටහනේ A හා B ලෙස දක්වා ඇත්තේ ජීවින් සිදුකරන ක්‍රියාවලි දෙකකි.



i. ශාක හා සතුන් දෙකොටසම සිදුකරන A ක්‍රියාවලිය හඳුන්වන්න.

ii. ශාක පමණක් සිදුකරන B ක්‍රියාවලිය හඳුන්වන්න.

iii. ශාකවලට B ක්‍රියාව සිදුකිරීමට අවශ්‍ය ශක්තිය ලබාගන්නේ කෙසේ ද?

iv. B ක්‍රියාවලිය නිසා වායුගෝලයට ලැබෙන වායුව කුමක් ද?

v. ජීවීන් වර්ගීකරණය සඳහා දෙබෙදුම් සුචි යොදා ගනියි. පහත දෙබෙදුම් සුචිය සම්පූර්ණ කරන්න.

පොල්ගස, කොස්ගස, මිරිස් ගස, මීවන ශාක

- a. ....
  (පොල්ගස, කොස්ගස, මිරිස් ගස)
  - කඳ අතු බෙදී ඇත.
    c. .... d. ....
    - ඵලයේ කටු ඇත.
      f. ....
    - ඵලයේ කටු නැත
      g. ....
  - කඳ අතු බෙදී නැත.
    e. ....
- පුෂ්ප හට නොගන්නා ශාක
  b. ....

(ලකුණු 11)

03. සපයා ඇති වචන යොදාගෙන හිස්තැන් පුරවන්න.
(භංගුරතාවය, තන්‍ය, ආඝන්‍ය, දියමන්ති, ශක්ති, ප්‍රත්‍යස්ථතාව, වායු, පදාර්ථ, භෞතික, වයනය, දැඩි බව)

i. කුඩා බලයක් යොදා ඇදීමේදී ඇදෙන සුළු වීම .... නම් වේ.
ii. .... දැඩි බව ඉහළ ඝන ද්‍රව්‍යයකි.
iii. නිශ්චිත හැඩයක් මෙන්ම නිශ්චිත පරිමාවක් .... වලට නැත.
iv. .... යනු කුඩා බලයක් යෙදූ විට පහසුවෙන් කැඩීමට හෝ කුඩුවීමට ලක්වීමයි.
v. ආභරණ තැනීමේ දී රන්, රිදී හා තඹ වැනි ලෝහ ද්‍රව්‍ය උපයෝගී කරගනී. එම ලෝහ විවිධ හැඩවලට සකස් කරගැනීමේ දී . ... ගුණය හා .... ගුණය වැදගත් වේ.
vi. ස්කන්ධයක් සහිත අවකාශයේ ඉඩක් අත්කර ගන්නා ද්‍රව්‍ය .... ලෙස හැඳින්වේ.
vii. යම් ද්‍රව්‍යයක් අතින් ස්පර්ශ කිරීමේදී අතට දැනෙන ගතිය .... නම් වේ.
viii. සීරීමට, ගෙවීයාමට හා කැපී යාමට එරෙහිව ද්‍රව්‍යයක් සතු ප්‍රතිරෝධය .... නම් වේ.
ix. පදාර්ථ ඒවා පවතින ....අවස්ථාව අනුව ඝන, ද්‍රව හා වායු ලෙස වර්ග කළ හැකිය.
x. ස්කන්ධයක් නොමැති අවකාශයේ ඉඩක් නොගන්නා දෑ .... ලෙස වර්ග කෙරේ.

(ලකුණු 11)

04. A. පහත දක්වා ඇත්තේ විද්‍යා ක්‍රියාකාරකම් වලදී භාවිත කරන උපකරණ කිහිපයකි. එක් එක් උපකරණයේ නම සහ එම උපකරණය භාවිතා කරන අවස්ථාවක් ලියන්න.

i.
a. නම - ....
b. භාවිතය - ....



ii.
a. නම - ....
b. භාවිතය - ....



iii.
a. නම - ....
b. භාවිතය - ....

B. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. පෘථිවි පෘෂ්ඨයේ පවතින පරිභෝජනයට ගත හැකි ජල ප්‍රතිශතය කොපමණ ද?
ii. පෘථිවි පෘෂ්ඨයේ ඝන අවස්ථාවේ පවතින ජල ප්‍රතිශතය කොපමණ ද?
iii. වායු අවස්ථාවේ ඇති ජලය කුමන නමකින් හඳුන්වයි ද?
iv. ලුණු ලේවාය තුළ දී ලුණු නිපදවීමට මුහුදු ජලයට කුමක් කළ යුතුද?
v. ළිං හා උල්පත් වලින් ලැබෙන ජලය කුමන නමකින් හඳුන්වයි ද? (ලකුණු 11)

05. පහත දැක්වෙන වගන්ති හරි නම් " √ "ලකුණ ද, වැරදි නම් " X " ලකුණ ද, ඉදිරියෙන් යොදන්න.

i.	කාර්යය කිරීමේ හැකියාව ශක්තියයි.	( )
ii.	සූර්යයා ශක්ති ප්‍රභවයක් නොවේ.	( )
iii.	පෙට්‍රල් යනු අප භාවිතා කරන ප්‍රධාන ජෛව ස්කන්ධය යි.	( )
iv.	පෙට්‍රෝලියම් තෙල්, පෙට්‍රෝලියම් වායු පොසිල ඉන්ධන ලෙස හඳුන්වයි.	( )
v.	උස් ස්ථානයක ඇති ජලයේ චාලක ශක්තිය ඇත.	( )
vi.	උදම් රළ මගින් විදුලිය උත්පාදනය කළ හැකිය.	( )
vii.	පරමාණු වලින් න්‍යෂ්ටික ශක්තිය ලබා ගනියි.	( )
viii.	චන්ද්‍රිකා ගමන් කරවීමට අවශ්‍ය ශක්තිය ලබා ගන්නේ සූර්ය කෝෂ මගිනි.	( )
ix.	ආහාර වල අඩංගු වන්නේ සූර්ය ශක්තියයි.	( )
x.	සුළං විදුලි බලාගාරයක් හලාවත පිහිටා තිබේ.	( )
xi.	සියළුම ශක්ති ප්‍රභව දිනෙන් දින ක්ෂය වෙමින් පවතී.	( )

(ලකුණු 11)

06. A. ශබ්දය හෙවත් ධ්වනිය ඇතිවන්නේ කම්පන හේතුවෙනි.

i. ධ්වනිය නිපදවන වස්තු කුමන නමකින් හඳුන්වයි ද?
ii. ඉහත (i) හි ඔබ සඳහන් කළ පිළිතුරට උදාහරණ 2 ක් දෙන්න.
iii. මිනිසාට ඝෝෂාකාරී ශබ්ද ඇසෙන ස්ථාන 2 ක් සඳහන් කරන්න.
iv. ශබ්දය ශ්‍රවණය කිරීම සඳහා ඇති මිනිසාගේ සංවේදී ඉන්ද්‍රිය කුමක් ද?
v. a) එම ඉන්ද්‍රියට හානි සිදුවියහැකි අවස්ථාවක් සඳහන් කරන්න.
b) සිදුවන හානි අවම කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

B. ධ්වනිය උපදවන සරල උපකරණයක් මෙම රූපයේ දැක්වේ.

i. මෙම උපකරණයෙන් ශබ්දය නිපදවන්නේ කෙසේ ද?
ii. වෙනත් ක්‍රමයකට ශබ්දය නිපදවීම සඳහා සාදාගත හැකි උපකරණයක රූපයක් අඳින්න.
iii. සංගීතය ලෙස හඳුන්වන්නේ කුමක් ද?

(ලකුණු 11)



07.A. පහත දක්වා ඇත්තේ චුම්බකයකට යකඩ ඇණ ආකර්ශනය වී ඇති ආකාරයයි.

i. මෙහි දක්වා ඇති චුම්බකයේ වැඩි වශයෙන් යකඩ ඇණ ආකර්ෂණය වී ඇති ස්ථාන කුමන නමකින් හඳුන්වයිද?

ii. ඉහත (i)හි සඳහන් කළ ස්ථානවලට පමණක් වැඩිපුර යකඩ ඇණ ආකර්ෂණය වීමට හේතුව කුමක්ද?

iii. a) පහත A හා B අවස්ථා දෙකෙන් චුම්බක දෙක ආකර්ෂණය වන්නේ කුමන අවස්ථාවේ දී ද?

b) එයට හේතුව කුමක් ද?



iv. චුම්බකයක චුම්භක ක්ෂේත්‍රය ලෙස හඳුන්වන්නේ කුමක්ද?

v. චුම්බකයක චුම්බක බලයට හානි සිදුවන අවස්ථාවක් ලියන්න.

vi. මාලිමාව භාවිත කර දිශාව සොයා ගැනීම වැදගත්වන අවස්ථාවක් ලියන්න. (ලකුණු 07)

B. පහත ද්‍රව්‍ය ලැයිස්තුවෙන් චුම්බකයකට ආකර්ෂණය වන ද්‍රව්‍ය හා නොවන ද්‍රව්‍ය වෙන්කර වගුවේ දක්වන්න.

" යකඩ ඇණ | පිත්තල ඇණ | ඇලුමිනියම් කැබලි | ලී කැබලි
ප්ලාස්ටික් කැබලි | ඉදිකටුවක් | සත පනහේ කාසියක් | අල්පෙනෙත්තක් "

චුම්බකයට ආකර්ෂණය වන ද්‍රව්‍ය	චුම්බකයට ආකර්ෂණය නොවන ද්‍රව්‍ය

(ලකුණු 04)